(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 28.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 අගෝස්තු 10 වැනි සිකුරාදා අ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

**ගරු කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

**ගරු වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා

**ගරු ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

**ගරු පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

**ගරු තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

**ගරු පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

**ගරු ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,** පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය

**ගරු දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු වසන්ත සේනානායක මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා,** විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු සෙය්යිඩ් අලි සාහීර් මවුලානා මහතා,** ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අංගජන් රාමනාදන් මහතා,** කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු මුත්තු සිවලිංගම් මහතා,** සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**

**ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

**ගරු රවී කරුණානායක මහතා**

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**

**ගරු ප්‍රසන්න රණවීර මහතා**

**ගරු ඉෂාක් රහුමාන් මහතා**

**ගරු මුජිබුර් රහුමාන් මහතා**

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**

**ගරු චමල් රාජපක්ෂ මහතා**

**ගරු ගාමිණී ලොකුගේ මහතා**

**ගරු ජානක වක්කුඹුර මහතා**

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු ඩුලිප් විජේසේකර මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

නීල් ඉද්දවල මහතා, වැඩබලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"2015 අගෝස්තු 15 වැනි දින පවත්වනු ලැබූ මහ මැතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානය යටතේ තේරී පත්වූ මන්ත්‍රීවරයන් අට දෙනෙකුගේ අත්සනින් යුක්තව, විරුද්ධ පාර්ශ්වයේ සිටින මුළු මන්ත්‍රී සංඛ්‍යාව 93ක් බවත්, එයින් මන්ත්‍රීවරයන් 70 දෙනෙකු වෙනුවෙන් පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දිනේෂ් ගුණවර්ධන මහතා වෙත ලබාදෙන ලෙස 2018 අගෝස්තු 01 වැනි දින මා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමට අනුව වර්තමාන අටවැනි පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය පිළිබඳව මතුවී තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් ගැඹුරු අධ්‍යයනයකින් අනතුරුව මාගේ තීරණය අවසාන වශයෙන් ප්‍රකාශ කිරීමට අදහස් කරමි.

තවද, එම ඉල්ලීමේ සඳහන් පාර්ලිමේන්තු විවාද සඳහා කාලය ලබාදීම සහ කාරක සභා නියෝජනය පිළිබඳවද සලකා බැලූ අතර ඒ සම්බන්ධයෙන්ද මාගේ තීරණය දැනුම් දීමට අදහස් කරමි.

2018 අගෝස්තු 07 වැනි අඟහරුවාදා පුරා පැය ගණනාවක් විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය පිළිබඳව පක්ෂ විපක්ෂ බොහෝ මන්ත්‍රීවරයන් විසින් මතු කරන ලද සියලු අදහස්ද, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව පුළුල් දැනුමක් ඇති අනෙකුත් විද්වතුන්ගේ අදහස්ද, ලෝකයේ අනෙකුත් පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ද, පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු රටවල සහ අන්තර් පාර්ලිමේන්තු සංගම් නියෝජනය කරන රටවල පිළිගත් සම්ප්‍රදායන්ද ඉතාමත් ගැඹුරින් අධ්‍යයනය කර මාගේ අදහස් මෙලෙස ප්‍රකාශ කරමි.

විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය පාර්ලිමේන්තු ඉතිහාසය මුළුල්ලේම පවත්වාගෙන එනු ලබන සම්ප්‍රදායන් හා පරිචයන්ට අනුකූලව අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලින් පිළිගෙන ඇති අභිමානවත් ධූරයකි. තවද, අප රටට ආවේණික වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රම සම්ප්‍රදායට සමගාමීව විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය ව්‍යවස්ථාදායකයටම අනන්‍ය වූ සහ පාර්ලිමේන්තු ක්‍රමයේ අත්‍යාවශ්‍ය ධූරයක් ලෙස සඳහන් කළ හැකි ය.

අපගේ පාර්ලිමේන්තු ඉතිහාසය ගැන සලකා බැලීමේදී විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය සඳහා ආණ්ඩුවට සම්බන්ධ නොවන වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින මහ මැතිවරණයට තරඟ කළ පිළිගත් දේශපාලන පක්ෂයක හෝ සන්ධානයක පාර්ලිමේන්තු නායකත්වය දරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කථානායකවරයා විසින් පිළිගෙන සභාවට ප්‍රකාශයට පත් කිරීමේ සම්ප්‍රදාය ඉතා පැහැදිලි සහ නිශ්චිත වූවක් බව මීට පෙර අවස්ථාවන් අධ්‍යයනයේදී, මොනවට පැහැදිලි වේ.

අපගේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළ විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය සඳහා කථානායකවරයා විසින් හඳුනාගනු ලැබුවේ මහ මැතිවරණයකදී තරඟ කරන ලද පිළිගත් දේශපාලන පක්ෂ අතුරින් ආණ්ඩු පාර්ශ්වයට අයත් නොවන බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින පක්ෂයේ හෝ සන්ධානයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ නායකයා වන බවයි.

මෙම සම්ප්‍රදාය මහා බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, කැනඩාව වැනි ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ක්‍රමය ක්‍රියාත්මකව පවතින රටවලද එලෙසම පවත්වාගෙන යනු ලබයි. අප අසල්වැසි ඉන්දියාවේ ද අවම ආසන සංඛ්‍යාවක් ලබාගැනීමේ සීමාවට යටත් වන නමුත් විරුද්ධ පාර්ශ්වයේ නායකයා වශයෙන් තෝරා පත්කරගනු ලබන්නේ ආණ්ඩු පාර්ශ්වයට අයත් නොවන අනෙකුත් පක්ෂ අතුරින් බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින පක්ෂයේ නායකයාය.

ඒ අනුව, විරුද්ධ පාර්ශ්වයේ නායකයා පත්කර ගැනීමේ ක්‍රමවේදය අප රටේ පැවති සම්ප්‍රදායත්, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය අනුගමනය කරනු ලබන අනෙකුත් රටවල සම්ප්‍රදායත්, සලකා බැලීමේදී ඒ පිළිබඳව කිසිදු මතභේදයක් නොමැති බව මා විසින් කරන ලද අධ්‍යයනයන් අනුව සඳහන් කිරීමට පුළුවන.

ඊළඟ කරුණ වන්නේ එම සම්ප්‍රදායට අනුගතව වර්තමාන පාර්ලිමේන්තුව තුළ පක්ෂ බෙදීම සහ සංයුතිය අනුව එම සිද්ධාන්තය අප අදාළ කරගන්නේ කෙසේද යන්න විමර්ශනශිලිව සලකා බැලීමය.

වර්තමාන තත්ත්වය පිළිබඳව නිසි අවබෝධයක් ලබාගැනීමට මත්තෙන්, 2015 ජනවාරි 08 වැනි දින පවත්වන ලද ජනාධිපතිවරණයෙන් අනතුරුව හත්වැනි පාර්ලිමේන්තුවේ ආණ්ඩු පාර්ශ්වය සහ විරුද්ධ පාර්ශ්වය නිර්මාණය වී තිබූ ආකාරය පිළිබඳව අප සලකා බැලිය යුතුමය.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා, එකී පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ මන්ත්‍රීවරයන් කණ්ඩායමක් ආණ්ඩු පාර්ශ්වය වශයෙන් ආණ්ඩු පාර්ශ්වයේ අසුන් ගන්නා ලද අතර එතෙක් ආණ්ඩු පාර්ශ්වයේ අසුන් ගෙන සිටි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ බහුතර මන්ත්‍රී සංඛ්‍යාව විරුද්ධ පාර්ශ්වයේ අසුන් ගන්නා ලදී.

එම අලුත් වාතාවරණය අනුව විරුද්ධ පාර්ශ්වයේ නායකයා ලෙස හඳුනාගත යුත්තේ කවුරුන්ද යන්න තීරණය කිරීමේදී, විරුද්ධ පාර්ශ්වයේ අසුන්ගත් බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය සඳහා පාර්ලිමේන්තුවේ පිළිගත් සම්ප්‍රදායන්ට අනුකූලව මාගේ පූර්වගාමී කථානායකවරයා විසින් පිළිගන්නා ලදී.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විරුද්ධ පාර්ශ්වයේ නායක ධූරය දරන ලද එම කාල සීමාව තුළදී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරයන් පිරිසක් අමාත්‍යවරයන් වශයෙන් ජනාධිපතිවරයා ඉදිරියේදී දිවුරුම් දෙන ලද අතර සම්ප්‍රදායානුකූලව ඔවුන්ටද ආණ්ඩු පාර්ශ්වයේ අසුන් වෙන් කරන ලදී.

එසේම, මීට ඉහතදී පැවති රජයන්වලදීද විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් මන්ත්‍රීවරයන් විවිධ අමාත්‍ය ධූරයන් භාර ගෙන ආණ්ඩු පාර්ශ්වයේ අසුන් ගත් අවස්ථාද, ආණ්ඩු පාර්ශ්වයේ අමාත්‍යවරයන් අමාත්‍ය ධූරවලින් ඉවත්වී විරුද්ධ පාර්ශ්වයේ අසුන් ගත් අවස්ථාද තිබෙන බව කවුරුත් දන්නා සත්‍යයකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවැනි සංශෝධනයේ 46 ව්‍යවස්ථාවේ (4) සහ (5) අනු ව්‍යවස්ථා ප්‍රකාරව ජාතික ආණ්ඩුවක් පිහිටුවීම පිණිස 2015 සැප්තැම්බර් 03 වැනි දින පාර්ලිමේන්තුවේදී ස්ථාවර නියෝග 47(1)(ඇ) විධිවිධානවලට අනුව නමින් සිය ඡන්දය භාවිතා කරමින් පක්ෂව මන්ත්‍රීවරයන් 143ක් සහ විපක්ෂව 16ක් වශයෙන් සම්මත කරන ලද යෝජනා සම්මතයට අනුකූලව දැනට බලාත්මකව පවතින ජාතික ආණ්ඩුවේ, එක්සත් ජනතා නිදහස් සන්ධානය හවුල්කාර පක්ෂයක් වීම නිසා වර්තමාන පාර්ලිමේන්තුවේ මෙම තත්ත්වය වෙනස් වී තිබෙන ආකාරය පිළිබඳව සලකා බැලීම අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්වී තිබේ.

ඒ අනුව, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරයන් පිරිසක් අමාත්‍ය ධූර දරමින් ආණ්ඩුවේ හවුල්කාර පක්ෂයක් ලෙස මේ වන විටත් කටයුතු කරමින් සිටින බැවින් එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් විරුද්ධ පාර්ශ්වයේ අසුන්ගෙන සිටින මන්ත්‍රීවරයන් සංඛ්‍යාව විරුද්ධ පාර්ශ්වයේ වෙනම පක්ෂයක් ලෙස පිළිගැනීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව 2015 සැප්තැම්බර් 03 වැනි දින වැඩි ඡන්දයෙන් සම්මත කරන ලද එකී යෝජනා සම්මතය අනුව හැකියාවක් මා හට නොමැත.

එබැවින්, අතීතයේ සිටම අඛණ්ඩව පැවැති පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුකූලව ආණ්ඩුවට සම්බන්ධ නොවන පාර්ලිමේන්තුවේ වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින පක්ෂයේ නායකයා පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකයා ලෙස කථානායකවරයා විසින් පිළිගනු ලැබීම චිරාත් කාලයක සිට පැවති සම්ප්‍රදායයි.

ඊට අනුකූලව, වර්තමාන අටවැනි පාර්ලිමේන්තුවේ ආණ්ඩුවට සම්බන්ධ නොවන විපක්ෂයේ අසුන් ගෙන සිටින වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ නායකයා වන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකයා ලෙස මා විසින් පිළිගන්නා ලද බව 2015 සැප්තැම්බර් 03 වැනි දින මෙම ගරු සභාවට ප්‍රකාශ කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

කරුණු මෙසේ හෙයින්, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායක ධුරය සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී වෙනසක් කිරීමට ව්‍යවස්ථානුකූලවත්, සම්ප්‍රදායානුකූලවත්, මේ උත්තරීතර සභාවේ කථානායකවරයා ලෙස මට හැකියාවක් නොපවතින බව මාගේ අවසාන තීරණය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව පිහිටුවන ලද ජාතික ආණ්ඩුවේ හවුල්කාර පක්ෂය ලෙස දැනට කටයුතු කරන එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරමින් විරුද්ධ පාර්ශ්වයේ අසුන්ගෙන සිටින මන්ත්‍රීවරයන්ට පාර්ලිමේන්තුව තුළ වාද විවාදවලට සහභාගි වීමේදී සාධාරණ කාලවේලාවක් වෙන්කර දීමටත්, දැනට පාර්ලිමේන්තුවේ ස්ථාපිත කර තිබෙන සියලුම කාරක සභාවලට සාධාරණ ලෙස නියෝජනයක් ලබාදීමටත්, අවශ්‍ය සෑම පියවරක් ගනිමින් එම මන්ත්‍රීවරයන්ගේ අයිතීන් ආරක්ෂා කරන බව මම මෙහිලා විශේෂයෙන් අවධාරණය කරමි.”

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂයේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව පිළිගන්වා, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2015 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් අවසන් වරට සංශෝධනය කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 5(15) වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජූලි 02 දිනැති 2078/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය පිළිගන්වා, එම නියෝගය රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) විදේශ කටයුතු අමාත්‍යවරයා විසින්, 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 05 දිනැති 2074/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින්—

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජුලි 11 දිනැති අංක 2079/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 2016 වර්ෂය සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම නියමය සහ වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) අධ්‍යාපන අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා, තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පාර්ලිමේන්තුවේ කටයුතු :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1, 2, 3, 4 සහ 5 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2018 අගෝස්තු 23 බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 වනතෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ. භා. 10.55 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

**5. පාසල් ශිෂ්‍ය විනය කමිටු පරීක්ෂණ විධිමත් පරිදි සිදුකිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම :** ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ඇතැම් පාසල්වල ශිෂ්‍යයන්ගේ විනය ගැටලුවලදී විධිමත් විනය පරීක්ෂණ සිදු නොකොට ශිෂ්‍යයන් පාසලෙන් ඉවත් කිරීමට

කටයුතු කරන අතර එමඟින් එම ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වී විශාල අසාධාරණයකට ලක්වීමත්, බොහෝ දරුවන් දැඩි මානසික පීඩනයකට පත් වී, මානසික රෝගීන් වීමත්, ඇතැම් දරුවන් සමස්ත ගුරු ප්‍රජාවට මෙන්ම, සමාජයටම වෛර කරමින් සමාජ විරෝධී අපරාධකරුවන් වූ අවස්ථා ද දක්නට ඇති හෙයින්, පාසල් ශිෂ්‍යයන්ගේ විනය විරෝධී ක්‍රියාවලදී වඩාත් විධිමත් පරිදි හා අපක්ෂපාතී විනය පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කිරීම සඳහා උචිත වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා. 1/’18)

(පූ. භා. 11.20 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

“ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය”යි, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 12.39 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. බදුල්ල මහ රෝහල ශික්ෂණ රෝහලක් ලෙස භාවිතා කරමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අනුබද්ධව රජයේ වෛද්‍ය පීඨයක් ආරම්භ කිරීම :** ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා, ගරු නිහාල් ගලප්පත්ති මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— අප රට තුළ ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වෛද්‍යවරුන් ප්‍රමාණයෙන් දැනට සිටින්නේ 50% ක් පමණ වන අතර අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාවෙන් ඉහළම සාමාර්ථ ලබා ගන්නා ශිෂ්‍යකයන් රැසකට රජයේ වෛද්‍ය පීඨවලට ප්‍රවේශවීමේ අවස්ථාව අහිමි වී ඇති අතර රජයේ අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාවන් ශක්තිමත් කිරීම සඳහා බදුල්ල මහ රෝහල ශික්ෂණ රෝහලක් ලෙස භාවිතා කරමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අනුබද්ධව රජයේ වෛද්‍ය පීඨයක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා. 2/’18)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. සියලුම විශ්වවිද්‍යාලවල දැනට පවතින නවක වදය සම්පූර්ණයෙන් නැවැත්වීම සඳහා පවතින නීති ක්‍රියාත්මක කිරීම :** ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— විශ්වවිද්‍යාල තුළ හෝ ඉන් පිටත නවක සිසුන්ට මුහුණ දීමට සිදුවන නවක වදය සම්පූර්ණයෙන්ම වැළැක්වීම හා 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත ප්‍රකාරව, එසේ නවක වදය ක්‍රියාත්මක කරන සියලුම පාර්ශ්වයන්ට නීතිය ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා.20/’18)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම :** ගරු අශෝක ප්‍රියන්ත මහතා, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පුත්තලම දිස්ත්‍රික්කය අතිශය සුන්දර වෙරළ තීරයකට හිමිකම් කීවද, වෙරළ ඛාදනය, කඩොලාන විනාශ වීම, අනවසර ඉදිකිරීම් වැනි හේතු නිසා වෙරළ තීරය දූෂණයට ලක්වී ඇති බැවින්, පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා. 23/’18)

"ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා මූලාසනාරූඪ විය යුතුය"යි , කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 1.40 ට ගරු මයිල්වාගනම් තිලකරාජා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. කල් තැබීම (කටාර් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් දෝහා හි ස්ටැෆර්ඩ් ශ්‍රී ලංකා පාසලට බලපෑම් කිරීම)** : "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි, පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 3.12ට, අද දින සභා සම්මතිය අනුව, 2018 අගෝස්තු 23 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 වන තෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.